# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 5 දරන
# මහා නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 පෙබරවාරි මස 4 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1975 පෙබරවාරි මස 21 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 5 දරන මහා නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 පෙබරවාරි මස 4 වන දින]

එල්.ඩී.—ඕ. 61/73.

මහා නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ප්‍රකෘති නාමය.*

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 5 දරන මහා නගර සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*184ආ වන අලුත් වගන්තිය 252 වන අධිකාරයෙහි ඇතුළත් කිරීම.*

2. පහත දැක්වෙන අලුත් වගන්තිය මහා නගර සභා ආඥාපනතේ 184අ වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ආඥාපනතේ 184ආ වන වගන්තිය වශයෙන් බලපවත්වන්නේ ය :—

*' විශ්‍රාම වැටුප් පරිවර්තනයට මනාපය පළ කර ඇති පළාත් පාලන සේවයේ සාමාජිකයන්ට සම්පූර්ණ විශ්‍රාම වැටුප් දීමේ බලය.*

184ආ. මහා නගර සභාවක් විසින් සේවයේ නියුක්ත කර ගනු ලැබූ පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු එම සේවයෙන් විශ්‍රාම ගන්නා හෝ විශ්‍රාම ගෙන ඇත්තා වූ සහ තම විශ්‍රාම වැටුප් පරිවර්තනය කරනු ලැබීමට මනාපය පළ කරන හෝ පළ කර ඇත්තා වූ විටක, ඔහු විශ්‍රාම ගත් දිනයේ සිට අවුරුදු දොළහකුත් මාස හයක් වූ කාල සීමාවක් ඉකුත් වූ දිනට පසු දිනය හෝ 1973 ජනවාරි මස 1 වන දිනය යන මින් පසුව යෙදෙන දිනයේ සිට, ඒ මනාපය ඔහු විසින් පළ නොකරනු ලැබිණි නම් ඔහුට ගෙවිය හැකිව තුබුණු පූර්ණ විශ්‍රාම වැටුප එම සභාව විසින් ඔහුට ගෙවනු ලැබිය හැකි ය.

මේ වගන්තියෙහි "පළාත් පාලන සේවයේ සාමාජිකයා" යන්නෙන්—

(අ) (264 වන අධිකාරය වූ) පළාත් පාලන සේවා ආඥාපනතින් ; හෝ

(ආ) 1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනතින් ; හෝ

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතින්

පිහිටුවන ලද පළාත් පාලන සේවයේ සාමාජිකයෙක් අදහස් වේ.'.

ඒ—11281—9197 (74/12)